# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

## අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය (III) කොටස - ප්‍රථම සෙමෙස්තරය - 2017/2018

## CTP 407 - විෂයමාලා න්‍යාය හා ක්‍රියාවලිය

**පැය තුනයි (03)**

**(අ) කොටසෙහි ප්‍රශ්න සියල්ලටම සහ (ආ) කොටසින් ප්‍රශ්න හතරකට (4) පිළිතුරු සපයන්න.**

---

### අ - කොටස

1. i. විෂයමාලාව යනු කුමක්ද යන්න අර්ථ දක්වන්න. (ලකුණු 2)

   ii. ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාවට අදාලවන පෙළපොත් සම්පාදනය කරනු ලබන්නේ කවර ආයතනයක් විසින් ද? (ලකුණු 2)

   iii. විෂයමාලාවක තිබිය යුතු මූලිකාංග තුනක් (3) දක්වන්න. (ලකුණු 3)

   iv. විෂයමාලා සංවර්ධනයට යොදා ගනු ලබන අරමුණු ආකෘතිවල මූලික ලක්ෂණ තුනක් (3) දක්වන්න.

   (ලකුණු 3)

   v. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක ජාතික විෂයමාලාවේ පොදු අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

   vi. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන විෂයමාලාවේ පොදු නිපුණතා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

   vii. විෂයාලාවක විෂය කරුණු තේරීමේ මූලික ක්‍රියාවලියක දී විෂයමාලා සම්පාදකයින් අවධානය යොමු කළ යුතු ප්‍රධාන සාධක තුන කුමක්ද?

   (ලකුණු 3)

   viii. සාමාන්‍ය අධ්‍යාපනයේ පරමාර්ථ තුන සඳහන් කරන්න. (ලකුණු 3)

## ආ - කොටස

1. i. ආපේක්ෂිත විෂයමාලාව යන්න අර්ථ දක්වන්න. (ලකුණු 2)

   ii. අපේක්ෂිත විෂයමාලාව සෑම පාසලකම අපේක්ෂිත මට්ටමින් ක්‍රියාත්මක නොවීමට හේතු පහදන්න. (ලකුණු 8)

   iii. සිරස් විෂයමාලාව සහ තිරස් විෂයමාලාව යන සංකල්පයේ උචිත ඉගෙනුම් අත්දැකීම් උදාහරණ ලෙසට ගෙන පැහැදිලි කරන්න.

   (ලකුණු 10)

2. i. ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන විෂයමාලාවේ විවිධ සංවර්ධන අවධීන් අනුපිළිවෙලින් ලියා දක්වන්න.

   (ලකුණු 5)

   ii. පාසල් විෂයමාලාව කෙරෙහි එල්ලවන අභියෝග යන්නෙන් කුමක් අදහස් කෙරෙයි ද? (ලකුණු 5)

   iii. ශ්‍රී ලංකාවේ වර්තමාන පාසල් විෂයමාලාව කෙරෙහි එල්ල වී ඇති අභියෝග ක්ෂේත්‍ර පහක් නම් කර එම අභියෝග විසඳීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

   (ලකුණු 10)

3. i. අරමුණු නොවන ආකෘති හා සන්සන්දනාත්මකව බලන කල අරමුණු ආකෘතිවල වාසි කවරේදැයි දක්වන්න.

   (ලකුණු 8)

   ii. විෂයමාලා සංවිධානයේ දී භාවිත කෙරෙන ආකෘති තුනක් නම් කර ඉන් වඩාත් සවිස්තරාත්මක ස්වරූපයක් ප්‍රදර්ශනය කෙරෙන ආකෘතියක් විස්තර කරන්න.

   (ලකුණු 12)

4. පහත සඳහන් මාතෘකා <u>දෙකක්</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.

අ. ලෝටන්ගේ විෂයමාලා සංවර්ධන ආකෘතිය

ආ. ශිෂ්‍ය කේන්ද්‍රීය විෂයමාලා න්‍යාය

ඇ. විෂයමාලා සංවිධාන රටා

ඈ. පරමාර්ථ අරමුණු හා සුවිශේෂී අරමුණු අතර පවතින අන්තර් සම්බන්ධතාවයේ ස්වභාවය

(ලකුණු 10x2 = 20)

5. i. පාසල් විෂයමාලාවක් සඳහා විෂය අන්තර්ගතය තේරීමේ දී උපයෝගී කර ගන්නා නිර්ණායක පහක් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. විෂයමාලා සම්පාදකවරුන්ට පාසල් විෂයමාලාවේ අන්තර්ගතය නිරතුරුවම සංශෝධනය කිරීමට බලපාන හේතු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

6. i. විෂයමාලා සම්පාදකවරු විෂය කරුණු තේරීම සිදු කරන සමස්ත ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. විෂයමාලා සම්පාදකවරු විෂය කරුණු තේරීමට යොදා ගන්නා ප්‍රවේශ (ක්‍රියාවලි) <u>හතරක්</u> දක්වා ඉන් <u>දෙකක්</u> පැහැදිලි කරන්න.

(ලකුණු 10)

oOoOoOoOoOoOoOo